www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: "වීර දින" කතාව එල්ටීටීඊයේ දේශපාලන බංකොලොත් භාවයේ ප්‍රකාශනයකි

## Sri Lanka: "Heroes Day" speech a symptom of the LTTE's political bankruptcy

**විජේ ඩයස් විසිනි**

**2006 දෙසැම්බර් 08**

දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ (එල්ටීටීඊ) නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් නොවැම්බර් 27 වන දා කල වාර්ෂික "වීර දින" කතාවෙන් එම සංවිධානය ශ්‍රී ලංකා මිලිටරියේ ප්‍රහාරයන් හමුවේ සැලකිය යුතු දේශපාලන අර්බුදයකට මුහුන දී සිටින බව අනාවරනය විය. ඔහු තම කතාවේ දී මහ බලවතුන්ගෙන් උදව් ඉල්ලා සානුකම්පික ලෙස ආයාචනය කල අතර තමා විසින් නියෝජනය කරනු ලබන්නේ යැයි කියන දෙමල මහජනතාවගේ අවශ්‍යතා සහ අභිලාෂයන් සපුරා ලීමේ කවර හෝ විසඳුමක් සම්පාදනය නොකලේ ය.

පසු ගිය වසර පුරා ම ශ්‍රී ලංකාන්ඩුව එල්ටීටීඊයට එරෙහිව මිලිටරිය මුදා හැර තිබේ. පලමුව " අතුරුදන් කිරීම්" සහ ඝාතනයන්ගෙන් සමන්විත පිලිකුල් සහගත සැඟවුනු යුද්ධයක් ගෙන ගිය එය ජුලි මාසයේ සිට 2002 සටන් විරාම ගිවිසුම විවෘතව ම උල්ලංඝනය කරමින් මිලිටරි ප්‍රහාරයන් දියත් කලේ ය. "සාම ක්‍රියා දාමය" සඳහා උනන්දු කරනවා වෙනුවට " ජාත්‍යන්තර ප්‍රජාව" කලේ ගැටුම් සම්බන්ධයෙන් එල්ටීටීඊයට චෝදනා කරමින් සාකච්ඡාවන්හි දී තව දුරටත් ලිහිල් ආකල්ප ඇති කර ගන්නා ලෙස එයට පීඩනය යෙදීම යි.

ප්‍රභාකරන්ගේ "වීර දින" කතා බොහෝ විට සිදු කෙරෙන්නේ තම ව්‍යාපාරයට ඇති සහයෝගය වර්ධනය කර ගැනීමේ සහ ඊලඟ වසර සඳහා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සම්පාදනය කිරීමේ අරමුනෙනි. එල්ටීටීඊයේ මර්දනකාරී පිලිවෙත්වලට ද දැවෙන සමාජ අවශ්‍යතා සපුරා ලීමට ඊට ඇති නොහැකියාවට ද එරෙහිව දෙමල ජනයා අතර වැඩෙන විරෝධය අපගමනය කරනු වස් මෙවන් අවස්ථාවන් උත්සව සිරි ගත් සන්දර්ශනයන් බවට වඩ වඩාත් පරිවර්තනය වූයේ සටන් විරාමයෙන් පසුව යි. උත්සව සැමරුම් මධ්‍යයේ මෙම කතාව එල්ටීටීඊ රූපවාහිනී නාලිකා ඔස්සේ සජීවී ලෙස විකාශය කිරීම ද එහි ම කොටසකි.

මිලිටරි නිල ඇඳුමෙන් සැරසී සිටි ප්‍රභාකරන් තම සංවිධානය රැක ගැනීමේ මංමුලා සහගත උත්සාහයක යෙදෙමින් තර්ජනාත්මක ඉරියව්වක් විදහා පෑවේ ය. යුද්ධය ඉහල නැංවීම සම්බන්ධයෙන් රාජපක්ෂ ආන්ඩුවට චෝදනා කල ඔහු දැඩිව ප්‍රකාශ කලේ සටන් විරාමය දැන් "අභාවයට" ගොස් ඇති බව යි. ඔහුගේ ප්‍රකාශය හුදෙක් යම් යම් කරුනු ගෙන හැර පෑ ප්‍රකාශයකට වැඩි දෙයක් නොවූ නමුදු එල්ටීටීඊය පිලිබඳව විශ්වාසයක් තැබිය නොහැකි බැව් "සනාථ" කිරීමට රාජපක්ෂ ආන්ඩුව එය ක්ෂනිකව ඩැහැ ගත්තේ ය. තෙදිනකට පසු ජනාධිපතිගේ සොහොයුරා වන ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඝාතනය කිරීමට උත්සාහ දැරීම මගින් ප්‍රභාකරන්ගේ ආස්ථානය අවධාරනය විය. එල්ටීටීඊයට එරෙහි මිලිටරි ක්‍රියාවන් උත්සන්න කිරීම සඳහාත් කුරිරු ත්‍රස්ත විරෝධී පනත ක්‍රියාත්මක කිරීම සඳහාත් ආන්ඩුව ඝාතන ප්‍රයත්නය ඩැහැ ගති.

ප්‍රභාකරන්ගේ කතා විලාසයෙන් සහ බෝම්බ ප්‍රහාරයෙන් ප්‍රකාශයට පත් වූයේ එල්ටීටීඊයේ ශක්තිය නො ව එහි දේශපාලන ක්‍රියා මාර්ගයේ බංකොලොත් භාවය යි. ශ්‍රී ලංකා රජයෙන් වෙන් වූ දෙමල ඊලම් ධනේශ්වර රාජ්‍ය කැබලිත්තක් දිවයිනේ උතුරු සහ නැගෙනහිර පලාත්වල ඇටවීම සඳහා වන ඉල්ලීම එල්ටීටීඊ නායකයා නැවත සහතික කලේ ය. "සිංහල ස්වෝත්තමවාදයේ සම්මුති විරහිත ක්‍රියා කලාපය විසින් දෙමල ජනයා සඳහා වන ස්වාධීන රාජ්‍යයකට සටන් වැදීම හැර අන් විකල්පයක් නොමැති තැනකට අප ඇද දමා ඇතැ"යි ඔහු පැවසී ය. සැලකිය යුතු ජාත්‍යන්තර පීඩනයක් හමුවේ 2002 සාම සාකච්ඡාවල දී එල්ටීටීඊය විසින් අත් හල එම සටන් පාඨය තව දුරටත් වලංගු නොවන්නක් බැව් සෑම අතකින් ම වාගේ පිලිගැනේ, එහි නායකත්වය විසින් ම පවා පිලිගනු ලැබේ.

එල්ටීටීඊයත් වෙන ම රාජ්‍යයක් සඳහා වන එහි ඉල්ලීමත් සෑම විට ම නියෝජනය කලේ දෙමල ධනේශ්වරයේ අවශ්‍යතා මිස දෙමල කම්කරුවන්ගේ හා පීඩිත ජනයාගේ අවශ්‍යතා නො වේ. අනෙකුත් දෙමල සුලු ධනේශ්වර රැඩිකල් කන්ඩායම් ලෙසින් ම, රටේ දෙමල සුලුතරයට එරෙහිව ශ්‍රී ලංකාවේ ආන්ඩුව සහ රාජ්‍යය විසින් ක්‍රමානුකූලව ගැඹුරු කරන ලද කෙනෙහිලිකම්වලට ප්‍රතිචාරයක් ලෙස 1970 ගනන්වල

දී එල්ටීටීඊය පැන නැගින. සිංහල ස්වෝත්තමවාදයට එල්ටීටීඊය දැක්වූ ප්‍රතිචාරය වූයේ ශ්‍රී ලංකාන්ඩුවේ අපරාධ සම්බන්ධයෙන් සිංහල කම්කරුවන්ට සහ ගොවීන්ට වරද පටවන, තමාට ම සුවිශේෂිත වූ වර්ගයේ ප්‍රතිගාමී වාර්ගික දේශපාලනයක් වර්ධනය කිරීම යි. විශේෂයෙන් ම 1983 දී යුද්ධය පුපුරා යාමෙන් පසු පෙරට දැමූ අධිෂ්ඨානශීලී ගරිල්ලා ක්‍රමෝපායන් තුලින් ද දෙමල සුලු ජනතාව අතර ක්‍රියාත්මක වන තම දේශපාලන එදිරිවාදීන් කුරිරු ලෙස විනාශ කිරීම මගින් ද එය අනුගාමිකත්වයක් දිනා ගත්තේ ය.

එල්ටීටීඊයේ ඉදිරි දර්ශනය සම්බන්ධයෙන් ගත් කල ආරම්භයේ සිට ම එය දෙමල ඊලමයක් පිහිටුවීම සඳහා ආධාර ලබා ගනු වස් ඒ හෝ මේ ප්‍රධාන බලයන් සමග බැඳී ගත් අතර මෙහි ප්‍රතිඵලය ලෙස දෙමල මහජනතාවට එක් ආවෘත අන්තයකින් තවෙකකට ඇද වැටෙන්නට සිදු විය. අගමැති රජීව් ගාන්ධිගේ ඉන්දියානු ආන්ඩුව කෙරෙහි විශ්වාසය තබනු වස් දෙමල ජනයා දිරි ගන්වමින් එල්ටීටීඊය 1987 ඉන්දු-ලංකා ගිවිසුමට සහාය දැක්වී ය. උතුරු පලාතේ රඳවා සිටි ඉන්දියානු "සාම සාධක" හමුදාවන් විසින් එල්ටීටීඊය බලාත්කාරයෙන් නිරායුධ කිරීමටත් ගිවිසුමට එරෙහි වන්නන් මර්දනය කිරීමටත් උත්සාහ ගනිත් ම සටන් ඇරඹින.

2002 දී එල්ටීටීඊය සාම ක්‍රියා දාමයට ඇතුලු වූයේ " ශක්තිමත් තත්වයක සිට" බවට ප්‍රභාකරන් ඔහුගේ කතාවේ දී පුරසාරම් දෙඩූ නමුදු ඔවුන් දැන් ආරක්ෂනවාදී තත්වයක සිටින්නේ මන්දැයි ඔහු කිසි සේත් ම පැහැදිලි නොකලේ ය. මැද පෙරදිග පීඑල්ඕ සහ දකුනු අප්‍රිකාවේ ඒඑන්සී වැනි ජාතිකවාදී ධනේශ්වර සන්නද්ධ ව්‍යාපාරයන් පොදුවේ ගත් මාවත අනුයමින් 1990 ගනන්වල දී එල්ටීටීඊය පරිනාමය විය. සීතල යුද්ධයේ නිමාවත් සමග ම ප්‍රධාන බලයන් අතර උපාමාරු දැමීමට ඔවුන්ට තිබූ හැකියාව සීමා වූ අතර භූගෝලීය නිෂ්පාදනයේ නැගීම හේතුවෙන් ජාතික ආර්ථික පරිපාලනය මත පදනම් වූ නව රාජ්‍යයන් පිහිටුවීමේ ව්‍යාපෘති වල දැමින. මෙම සංවිධාන එකකට පසු එකක් ඔවුන්ගේ "අධිරාජ්‍ය විරෝධී" වාග් මාලාව අත් හරිමින් අධිරාජ්‍යවාදීන් විසින් අධීක්ෂිත සාකච්ඡා මේසවලට තල්ලු වී දේශපාලන සංස්ථාපිතයේ ස්ථානයක් සඳහා තම තුවක්කු හුවමාරු කර ගත්තේ ය.

එල්ටීටීඊය සාකච්ඡා මේසයට පැමිනියේ 2000 දී ශ්‍රී ලංකාවේ මිලිටරියට පරාජයන් මාලාවක් අත් කර දීමෙන් පසුව ය යන්න සත්‍යයකි. මූලෝපායික වශයෙන් වැදගත් අලිමංකඩ කඳවුර සහ යාපනය අර්ධද්වීපයෙන් සැලකිය යුතු කොටසක් එල්ටීටීඊය විසින් අත්පත් කර ගැනීම හේතුවෙන් කොලඹ පාලක ප්‍රභූව තුල භීතියක් ජනිත කෙරින. කෙසේ නමුදු, 2000 දී ආරම්භ නොවූ සටන් විරාමය සහ සාම සාකච්ඡා එක්සත් ජනපදයට එල්ල වූ සැප්තැම්බර් 11 ප්‍රහාරයෙන් පසු ඇරඹින. ශ්‍රී ලංකාවේ පාලක ප්‍රභූවෙන් සැලකිය යුතු කොටසක් තමාගේ ම කොන්දේසි යටතේ එල්ටීටීඊය සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීම සඳහා හෝ එසේ නො වේ නම් බුෂ් පරිපාලනයේ ඊනියා "ත්‍රස්තයට එරෙහි යුද්ධයේ" ඉලක්කයක් බවට එය පත් කිරීම සඳහා හෝ මෙම අවස්ථාව ඩැහැ ගත්තේ ය.

එල්ටීටීඊය දුර්වල දේශපාලන තත්වයක සිට සාම සාකච්ඡාවලට ඇතුලු වූයේ ය යන්න එහි මිලිටරි ජයග්‍රහනයන් විසින් වෙනස් නොකෙරින. 2001 දෙසැම්බරයේ දී මෙය පිලිගනිමින් එල්ටීටීඊයේ ප්‍රධාන සාකච්ඡාකරු ඇන්ටන් බාලසිංහම් කනස්සලු ස්වභාවයෙන් මෙසේ ප්‍රකාශ කලේ යඃ "බින් ලාඩන් නම් වූ උමතු මිනිසෙක් ඇමරිකාව සමග ගැටුනා. දැන් සමහර රටවල් ඔවුන්ගේ ත්‍රස්තවාදීන් පිලිබඳ ලැයිස්තුවට අප ද ඇතුලත් කර තිබෙනවා." ප්‍රභාකරන්ගේ මෑත ම කතාව තුල ශ්‍රී ලංකාවෙන් පිටත විශේෂයෙන් ම ඇෆ්ඝනිස්ථානය සහ ඉරාකය තුල සිදු වන සිද්ධීන් සම්බන්ධයෙන් කිසිවක් සඳහන් නොවීම අර්ථ දනවන කරුනකි. එල්ටීටීඊය කිසි විටෙකත් බුෂ්ගේ "ත්‍රස්තයට එරෙහි යුද්ධයට" විරුද්ධ වී නොමැති අතර වොෂින්ටනයේ ත්‍රස්තවාදී සංවිධාන ලැයිස්තුවෙන් තමාගේ නම ඉවත් කරන ලෙස හුදු ආයාචනයක් පමනක් කර තිබේ.

සාම ක්‍රියා දාමයට අත්සන් කිරීම මගින් වෙන් වූ දෙමල රාජ්‍යයක් පිලිබඳ තම ඉල්ලීම ක්ෂනිකව අත් හල එල්ටීටීඊය කම්කරු පන්තිය අන්‍යෝන්‍ය වශයෙන් සූරා කෑම සඳහා සිංහල සහ දෙමල පාලක ප්‍රභූව අතර ඇටවෙන බලය බෙදා ගැනීමක් තුල භූමිකාවක් හිමි කර ගැනීම සඳහා මාන බැලී ය. "ව්‍යාඝ්‍ර ආර්ථිකයක්" ස්ථාපනය කිරීම සඳහා එනම් ශ්‍රී ලංකාව ලාභ ශ්‍රම වේදිකාවක් බවට සහ කලාපීය ආයෝජන දොරටුවක් බවට පරිවර්තනය කිරීම සඳහා කොලඹ ආන්ඩුව සමග එක්ව වැඩ කිරීමේ එල්ටීටීඊ අභිප්‍රාය බාලසිංහම් විවෘතව ම ප්‍රකාශ කලේ ය.

කෙසේ නමුදු ආරම්භයේ සිට ම ශ්‍රී ලංකාන්ඩුව හෝ ප්‍රධාන බලයන් හෝ එල්ටීටීඊයට ප්‍රධාන දේශපාලන භූමිකාවක් පැවරීමට සූදානම්ව සිටියේ නැත. සටන් විරාමය සහ සාකච්ඡා යනු පාවා දීමක් යැයි සැලකූ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග, මිලිටරිය සහ ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල අන්තවාදී පක්ෂ එක්සත් ජාතික පක්ෂ නායකත්වයෙන් පැවති ආන්ඩුවට නිරන්තර පීඩනයක් යෙදී ය. එල්ටීටීඊයට එරෙහි මිලිටරි සහ දේශපාලන ප්‍රකෝපකරනයන් මාලාවකට පසු අවසාන සාම ගිවිසුමක කොන්දේසි පිලිබඳව කවර හෝ සංයුක්ත සාකච්ඡාවකින් තොරව 2003 දී සාකච්ඡා බිඳ වැටින.

පසු ගිය තෙවසර පුරා ම, සම්මුතියකට පැමිනෙනු වස් කොලඹ ආන්ඩුවට පීඩනය යොදන ලෙස එල්ටීටීඊය ජාත්‍යන්තර ප්‍රජාවට නැවත නැවතත් ආයාචනය කල නමුදු එය පරිපූර්නව ම අසාර්ථක විය. අඛන්ඩ ප්‍රකෝපකරනයන් නො තකමින් සටන් විරාමය පවත්වා ගෙන යාමටත් එකඟතාවක් සඳහා සාකච්ඡා කිරීමටත් එල්ටීටීඊයට පසුපසට නැමෙන්නට සිදු වූ බැව් ප්‍රභාකරන් අවධාරනය කලේ ය. "සාම ව්‍යායාමයන් සඳහා තව තවත් අවස්ථා ලබා දෙනු වස් වරෙක සුනාමි ව්‍යසනය සිදු වූ මොහොතේත් නැවත රාජපක්ෂ බලයට පත් වූ අවස්ථාවේත් අපගේ විමුක්ති අරගලය ඉදිරියට ගෙන යාමේ සැලැස්ම අපි කල් දැමුවෙමු" යි ඔහු ප්‍රකාශ කලේ ය.

2004 දෙසැම්බරයේ දී සුනාමිය විසින් ශ්‍රී ලංකාවේ වෙරල තීරයෙන් වැඩිමනත් කොටසක් විනාශ වූ අවස්ථාවේ ශ්‍රී ලංකාවේ සිංහල, දෙමල හා මුස්ලිම් ජනවර්ගයන්ට අයත් සාමාන්‍ය වැඩ කරන ජනතාව ස්වයංසිද්ධව එකිනෙකාට උදව් කර ගත්හ. මෙම පන්ති හැඟීමට කවර හෝ දේශපාලනික ආයාචනයක් කිරීමට ඓන්ද්‍රියව අසමත් එල්ටීටීඊය ඒ වෙනුවට කලේ සාම ක්‍රියා දාමය නැවත අරඹනු වස් පීඩනය යෙදීම සඳහා අවස්ථාව ඩැහැ ගැනීමට උත්සාහ කිරීම යි. සුනාමි ආධාර පරිපාලනය කිරීම සඳහා පශ්චාත් සුනාමි මෙහෙයුම් කලමනාකරන ව්‍යුහය (PTOMS) නම් තාවකාලික ඒකාබද්ධ දේහයක් සඳහා ජනාධිපති කුමාරතුංග සමග ගිවිසුමක් අත්සන් කෙරින. නමුදු 2005 දී විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීමෙන් පසු ජවිපෙ විසින් උත්සන්න කෙරුනු වාර්ගික උද්ඝෝෂනය මධ්‍යයේ එම දේහය කිසි විටෙක ක්‍රියාත්මක නොවුනි.

2005 නොවැම්බරයේ දී ජනාධිපතිවරනය කැඳවින. ජවිපෙ පිටුබලය සහිතව රාජපක්ෂ යන්තමින් ඉන් ජය ගත්තේ ය. රාජපක්ෂගේ මැතිවරන වැඩ පිලිවෙල සටන් විරාමයට විවෘතව ම එරෙහි වුව ද එල්ටීටීඊයේ පිලිවෙත වූයේ දෙමල ජනතාව අතර තමාට ඇති සහාය ප්‍රදර්ශනය කරනු වස් මැර බලයෙන් ක්‍රියාත්මක කෙරුනු බෙලහීන මැතිවරන වර්ජනයකි. ප්‍රචන්ඩත්වයේ තර්ජන යොදා ගනිමින් යාපනයේ පැවති සමාජවාදී සමානතා පක්ෂයේ මැතිවරන රැස්වීමක් අවහිර කිරීම මගින් එහි ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රමවේදයන් මනාව අනාවරනය කෙරින. මැතිවරනය ආසන්නයේ දී පසු ගිය වසරේ " වීර දින" කතාව කරමින් ප්‍රභාකරන් ප්‍රකාශ කලේ, රාජපක්ෂ "සාම ක්‍රියා දාමය කෙසේ හසුරුවන්නේ ද, ඔහු අපේ ජනතාවට සාධාරනය ඉටු කරන්නේ ද" යන්න එල්ටීටීඊය "නැවතී සිට නිරීක්ෂනය" කරන බව යි.

පිලිතුරු ලැබීමට කල් ගත වූයේ නැත. මඩකලපුවේ පල්ලියක නත්තල් උදාවේ දේව මෙහෙයකට සහභාගි වෙමින් සිටි එල්ටීටීඊයට හිතවත් ප්‍රමුඛ පෙලේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ජෝසෆ් පරරාජසිංහම් නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තබා ඝාතනය කෙරින. සැම අතින් ම විය හැක්කේ මෙම ඝාතකයන් මිලිටරියේ හෝ එය සමග එක්ව ක්‍රියා කරන අර්ධ මිලිටරි කන්ඩායමක අය ය යන්න යි. ප්‍රභාකරන් මෙම වසරේ තම "වීර දින" කතාවෙන් සැලකිය යුතු ප්‍රමානයක් උතුරු නැගෙනහිර දෙපලාතේ වෙසෙන දෙමල ජනතාවගේ දුක්පීඩාවන් ලැයිස්තු ගත කිරීමට වැය කලේ ය. "සාම සාකච්ඡා හරහා වාර්ගික ගැටුමට විසඳුමක් සොයා ගැනීම සඳහා" එල්ටීටීඊය මත් කැප කිරීමට සිදු වූ බැව් ඔහු ප්‍රකාශ කලේ ය. නමුදු පෙරලා ලැබුනු දෙයක් නොමැත. "ඒ වෙනුවට තමාට සාධාරනය ඉටු වෙතැයි බලාපොරොත්තු වූ දෙමල ජනයා මත මරන සහ විනාශයන් පැටවුනි."

එල්ටීටීඊය ශ්‍රී ලංකාවේ ආන්ඩු සමග සාකච්ඡාවේ යෙදුනු අතර ඔවුන් කෙරෙහි විශ්වාසය තබන ලෙස වැඩ කරන ජනතාව දිරි ගන්වා තිබුනි. එහෙත් ප්‍රභාකරන් එම ආන්ඩුවලට චෝදනා කරනු වෙනුවට සාමාන්‍ය සිංහල ජනතාවට චෝදනා කලේ ය. ඔහු මෙසේ පැවසී යː "සිංහල ජාතිය මහාවංසයේ මිථ්‍යා ප්‍රබන්ධී දෘෂ්ටිවාදය මගින් මුලා කොට එමගින් නිර්මානය කෙරුනු ස්වෝත්තමවාදී හැඟීම් තුල සිර ගත කොට ඇත.... අවාසනාවන්ත ලෙස මෙය ශිෂ්ට සම්පන්න ආකාරයකින් දෙමල ජාතික ප්‍රශ්නය විසඳීම සඳහා අවංක උත්සාහයක් දැරීමෙන් සිංහල ජාතිය වලකා ලයි."

මේ සියල්ල පවසනු ලැබුවේ පශ්චාත්තාපී ස්වරයෙනි. අන්තර්වාර කැබිනට් ධුරයන් සඳහා සහ පාර්ලිමේන්තු අසුන් සඳහා තම ආයුධ බිම තැබීමට පසු ගිය මාසයේ ආන්ඩුව සමග ගිවිසුම් අත්සන් කල නේපාල මාඕවාදීන් සිටින තත්වයට යම් දුරකින් ප්‍රභාකරන් සහ එල්ටීටීඊ නායකයන් සිටිනා බවට සැකයක් නැත. සටන් විරාමය "අභාවයට" ගොස් ඇති බවට ප්‍රභාකරන් කල ප්‍රකාශය සහ පසු ගිය සතියේ කොලඹ සිදු කල බෝම්බ ප්‍රහාරය අර්ථාන්විත සාකච්ඡා සඳහා කොලඹ ආන්ඩුව නැවත තල්ලු කිරීම සඳහා ප්‍රධාන බලයන්ට කරන ලද මංමුලා සහගත ආයාචනයකට වැඩි යමක් නො වේ. කෙසේ නමුත්, මෙම තර්ජනයන් මගින් සරලව ම තහවුරු කෙරෙන්නේ එල්ටීටීඊය පරිපූර්න වශයෙන් ම දේශපාලනික ආවෘත අන්තයකට පැමින ඇති බව යි. මෙය පුද්ගලික අමනකමක හෝ පාවා දීමක ප්‍රතිඵලයක් නොවන අතර දෙමල බෙදුම්වාදී ක්‍රියා මාර්ගයේ ඇති හිස් බව පරිපාකයට පත් වීමකි.

ප්‍රථම කොට ම, බුෂ් පරිපාලනයේ යුද අපරාධ කෙරෙන් දෑස් ඉවතට හරවා සිටින "ජාත්‍යන්තර සාම ක්‍රියා දාමයක්" පිලිබඳව ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියට

විශ්වාසයක් තැබිය නොහැකි ය. එවන් සාකච්ඡාවලින් මතු වන කවර හෝ එකඟතාවක් සේවය කරනු ඇත්තේ සුවිසල් ලාභ ශ්‍රම තටාකයක් ලෙස ඉන්දියානු උපමහාද්වීපය දකිමින් එයට වඩ වඩාත් බැලුම් හෙලන මහ බලවතුන්ගේ අවශ්‍යතා වෙනුවෙනි. දෙමල, සිංහල සහ මුස්ලිම් කම්කරුවන්ගෙන් අතිමහත් බහුතරයකට යුද්ධයේ නිමාවක් අවශ්‍ය බව නිසැක ය. එනමුදු එය එල්ටීටීඊය ද අන්තර්ගත පාලක ප්‍රභූවේ විවිධ දේශපාලන පක්ෂ සහ සංවිධාන හරහා සාක්ෂාත් කර ගත නොහැකි ය.

සමාජවාදී ක්‍රියා මාර්ගයක පදනම මත කම්කරුවන් සහ පීඩිත මහජනතාව එකමුතු කිරීම සඳහා ධනපති පන්තියේ සියලු ම කොටස්වලින් ස්වාධීන වූ දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැගිය යුතු ය. එවන් ඉදිරි දර්ශනයක ආරම්භක ලක්ෂ්‍යය වන්නේ සියලු ම ආකාරයේ ජාතිකවාදයන් සහ ස්වෝත්තමවාදයන් එනම් සිංහල අධිපතිවාදය සහ දෙමල බෙදුම්වාදය එක සමානව ප්‍රතික්ෂේප කිරීම යි. දෙමල කම්කරුවන්ගේ ස්වාභාවික සගයන් වන්නේ එල්ටීටීඊය සහ එහි ධනේශ්වර නියෝජිතයා වන දෙමල ජාතික සන්ධානය නො ව දිවයින පුරා සහ ජාත්‍යන්තරව විසිරී පැතිරී සිටින කම්කරු පන්තිය යි. මෑත දී පැවැත්වූ කොන්ග්‍රස් මන්ඩල මැතිවරනයේ දී බුෂ් පරිපාලනය විසින් ඉරාකය තුල ගෙනයන යුද්ධයට දැවැන්ත විරුද්ධත්වයක් පෙන්නුම් කල ඇමරිකානු කම්කරු පන්තිය ද මෙයට අන්තර්ගත ය.

දශක දෙකකට වැඩි කාලයක් තථ්‍ය වශයෙන් ම මිලිටරි වාඩි ලා ගැනීමකට යටත් කොට තිබෙන දිවයිනේ උතුරෙන් සහ නැගෙනහිරෙන් ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවන් වහා ම සහ කොන්දේසි විරහිතව ඉවත් කරනු යැයි ඉල්ලා සිටින ලෙස සමාජවාදී සමානතා පක්ෂය කම්කරු පන්තියට කැඳවුම් කරයි. අතිමහත් බහුතරයක අවශ්‍යතාවන්ගේ සහ අභිලාෂයන්ගේ වියදමෙන් ධනවත් අතලොස්සකගේ වරප්‍රසාද සහ ලාභ ආරක්ෂා කිරීම පදනම් කර ගත් පවත්නා සමාජ පර්යායට එරෙහි දේශපාලන අරගලයක් තුල කම්කරුවන් සහ පීඩිත මහජනතාවන් බලමුලු ගැන්වීමේ කොටසක් ලෙස සමාජවාදී සමානතා පක්ෂය ශ්‍රී ලංකා සහ ඊලම් සමාජවාදී සමූහාන්ඩුවකට සටන් වදී. එවන් අරගලයක් සමස්ත දකුනු ආසියාවේත් ජාත්‍යන්තරවත් සමාජවාදය සඳහා කරන පුලුල් සටනේ අත්‍යවශ්‍ය අංගයකි. සසප ඉදිරි දර්ශනය සහ ක්‍රියා මාර්ගය බැරෑරුම්ව සැලකිල්ලට ගන්නා ලෙසත් එයට බැඳී නව මහජන කම්කරු පක්ෂය ලෙස එය ගොඩ නගන ලෙසත් අපි සියලු කම්කරුවන්ගෙන් ඉල්ලා සිටිමු.

© www.wsws.org